**පිළියන්දල අධ්‍යාපන කලාපය**
Piliyandala Educational Zone

**10 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය - 2017**
Grade 10 - Second Term Test – 2017

**සිංහල භාෂාව හා සාහිත්‍යය II** | Sinhala Language & Literature II | **කාලය පැය 02**

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

---

01) **(i) සිට (X)තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) ඝෝෂ අක්ෂර දෙකක් නම් කරන්න.

(ආ)අනුස්වාරය හා විසර්ගය යෙදෙන වචන දෙකක් ලියන්න.

(ii) පාන්දර ම ගසට **නැග** පොල්කැඩු විමල් ඒවා **ලෙලිගසමින්** තාත්තාට උදව් විය.
මෙහි කළු අකුරින් මුද්‍රිත පදවල ක්‍රියා පදය පිළිවෙළින් ලියන්න.

(iii) (අ) රුහිරු

(ආ)රිසි යන පදවලට සමාන පද ලියන්න.

(iv) පහත වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න.

(අ) අපි විසින් විභාගය සඳහා සූදානම් වන්නෙමු.

(ආ)දක්ෂ ශිෂ්‍යයෝ සියල්ලන් ම තරගයට ඉදිරිපත් විය.

(v) පහත දී ඇති අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.

(අ) එක් කරදරයක් පිට තවත් කරදරයක්

(ආ)අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම.

(vi) පුරාණ +ඉක මඟින් පෞරාණික පදය සෑදී ඇති අන්දමට

(අ)ඉතිහාසය යන්නට "ඉක" ප්‍රත්‍යයද

(ආ)මොළොක් යන්නට "අටි" ප්‍රත්‍යයද යොදා තද්ධිත පද සාදන්න.

(vii) පහත සඳහන් පදවලට තනිපද ලියන්න.

(අ)දුරදිග බලා කටයුතු කරන-

(ආ)හිස නැති මළ කඳ-

(viii) පහත දැක්වෙන (අ) සහ (ආ)යෙදුම්වල පළමු වචනයේ හා දෙවන වචනයේ නො ගැළපීමක් ඇත. එබැවින් ගැළපෙන ලෙස පළමු වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.

(අ)කනිටු - පාඨශාලාව

(ආ)ශක්‍ර - දෙව්රජ

(ix)පහත සඳහන් ප්‍රාදේශිය ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාරය ලියන්න.

(අ)බුන්නා

(ආ)බස්කම්මා

(x) එකිනෙකට විරුද්ධාර්ථ හා පළමු පදයේ අර්ථය ඇති යුගල පද සඳහා උදාහරණ එක බැගින් ලියන්න

(ලකුණු 2X10 - 20 යි)

02) **පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තොරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

(අ)අධ්‍යාපනය ලොකු කුඩා සියලු දෙනා විසින් ම ලැබිය යුතු දෙයකි.නිදහස් අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම සෑම දෙනාම ලබාගත් තවත් විශේෂ වරප්‍රසාදයකි. සී.ඩබ්.ඩබ් කන්නන්ගර මැතිතුමා සියලු දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලබාදීමට කටයුතු කළේ ය. නමුත් ඒ ලබාදුන් වටිනාකමට නිසි පරිදි අධ්‍යාපනය ලබන පිරිස කෙතරම් අවමද? අපට ලබාදෙන අධ්‍යාපනය නිසි වයසේදී නියමිත පරිදි ලබාගත යුතුයි. අධ්‍යාපන කටයුතු නියමිත පරිදි සිදුනොවුනහොත් එය බලපාන්නේ තමන්ට සහ රටේ අනාගතයට ය.එබැවින් දරුවන්ට නියමිත වයසේදී අධ්‍යාපනය ලබාදී ඔවුන්ගේ අනාගතය සකසා දීම දෙමාපියන්ගේ ගුරුවරුන්ගේ සහ වගකිවයුතු සැමගේ කාර්යයක් බවත්, දරුවන් වශයෙන් නිසි වයසේදී අධ්‍යාපනය ලබාගැනීම අවශ්‍ය බව සිතාගත යුතුයි.

(ආ)දිනෙන් දින වැඩිවන මාර්ග අනතුරු නිසා පීඩා විඳින්නෝ බොහෝය. නීතිරීති කෙතරම් වැඩිවුවත් අනතුරුවල නිමාවක් නැත. පදිකයන් ද මෙහිදී රියදුරන් මෙන් ම වගකීම ගත යුතු වන්නේ මේ දෙපිරිස ම අතින් වැරදි සිදුවන නිසා ය.දඩ මුදලක් රියදුරන්ට මෙන් ම පදිකයන්ට ලබා දීම අවශ්‍යද නැද්ද කියා සෙවීම බලධාරීන් සතු රාජකාරියකි. එයින් රටේ සිදුවන අනතුරු අවම කරගැනීමට හැකි වන නිසාය.

(ඉ)දරුවන් තාක්ෂණ දැනුම ලබා ගැනීමට යොමුවන ප්‍රමාණය වර්තමානයේ අධික වී ඇත. එයට හේතුව හැකියා ,දක්ෂතා ,ඔප්නැංවීමට, අනාගතයේ තාක්ෂණ ලෝකය ජයගැනීමට ඒ පිළිබඳ හැදෑරීම අවශ්‍ය වන බැවිනි. රැකියා අවශ්‍යතා මෙන් ම දියුණු ලොවක් දැක ගැනීමට තාක්ෂණ දැනුම අවශ්‍ය විය යුතු ය. එමඟින් අද නොව හෙට අනාගතයේ දියුණු ලොවක් කරා ගමන් කිරීමට හැකිවනු ඇත.

(ඊ)පුංචි කාලේ ඉඳලම සුපුන් සංගීතයට දක්ෂතා දැක්වූයේ පෙර භවයෙන් ගෙනා දායාදයක් ලෙසයි. පාසලේ සිට ම සිය දක්ෂතා දියුණුකර ගත් ඔහු එක්තරා රූපවාහිනී නාලිකාවක් මගින් පවත් වන තරංගයටද ඉදිරිපත් විය. එහි අවසන් තරංගය ආසන්න වෙමින් ඇත. සුපුන් මේ සඳහා දිවා රෑ නො බලා පුහුණුවීම් සිදුකරයි......

මින් පසුව සිදුවන්නේ කුමක් දැයි නිර්මාණාත්මක රචනයක් ලෙස ලියන්න.

(ලකුණු 25 යි)

03)**පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.**

මාර්ටින් වික්‍රමසිංහ වැනි ලේඛකයාගේ ගවේෂණයට පාත්‍ර වූ මෙරට සමාජ පරිවර්තනය ඊට වඩා වෙනස් අයුරකින් ග්‍රහණය කොට ප්‍රතිනිර්මාණය කිරීමට හැත්තෑව දශකයෙන් මෑත භාගයට අයත් ඇතැම් නවකතාකරුවෝ පෙළඹුණහ. මේ සියවසේ පස්වැනි හා හයවැනි දශකයන්හි බිහි වූ නවකතා අතර ප්‍රමුඛත්වයෙන් සැලකුණු කෘතිවල අන්තර්ගත වූ මධ්‍යම පාන්තික ජීවිතය පිළිබඳ එක තැන පල්වෙන,ඒකාකාරී පරිකල්පනයෙන් පිටමංවූ ඇතැම් ලේඛකයන් විසින් මෙකල පීඩිත පාන්තික ජීවිතය විෂය කොටගත් නවකතා ගණනාවක් රචනා කෙරිණි. ඒ සමඟම ග්‍රාමීය හා නාගරික මැද පන්තියේ එතෙක් විවෘත නො කෙරුණු ප්‍රදේශයන් නිරීක්ෂණය කිරීමට තවත් ලේඛක පිරිසක් යොමු වූ අයුරු ද දක්නට ලැබේ.හැත්තෑව. දශකයෙන් ඇරඹෙන කාල වකවානුවෙහි දශක දෙකක පමණ කාලය තුළ දේශපාලන පරිව්‍යුහය මගින් සමාජ ජීවිතය කෙරෙහි ඇති වූ පෙළඹීමද නො තකා හළ නොහේ. සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි එතෙක් ආධිපත්‍යය ඉසිලූ යථාර්ථවාදය වෙනුවට අධියථාර්ථවාදය වෙත නැඹුරු වීමට ලේඛක පිරිසක් උත්සුක වූහ. (ලකුණු 10 යි)

04)පහත සඳහන් කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අඳුරු රැයේ රිදී සීනුවක් හැඬවෙන ලෙස
පතළ තිමිර නිහඬ පවුර බිඳ හැර දස දෙස
මේ ලෝවිත පුරවා සොම්නස් අම මදු රස
ගී සර පතුරන කොවුලෝ අසනු මගේ බස

නිල් කෙත්වතු දිය ඇලි හා මිණිමුතු මල් ගැන
අඳුරු රැයේ සොඳුරුගීත නිබඳව ගය මින
තුටුවන කොවුලෝ අසනුව මාගේ මේ පැන
ඔතරම් සරුසාරද ඔබ ජීවත්වන තැන

මිතුර ඔබේ පැනයෙන් මම මදක් මවිත වෙමි
එනමුත් නොවළහා නියම තතු පහදා දෙමි
සිසිලක් නැති වියළි මුඩු බිමක්ඇත මට හිමි
මහ බඹුගේ අණ විලසට එහි ම වෙසෙන්නෙමි

කෙත් වතු නැත දිය ඇලි නැත පිපුණු කුසුම් නැත
සදා වෙසෙමි සිසිලක් නැති ඒ මුඩුබිම මත
සොඳුරු ලොවක් නොදකින නින්දා මාගේ නෙත
මගෙ ගීයෙන් පියා හඹමි එවන් ලොවක් වෙත

(i) කොවුලා පතුරන්නේ කුමන දෙයක්ද?
(ii) කොවුලාගේ ජීවිතය සරුසාර යැයි කවියා සිතන්නේ කුමන හේතුවක් නිසාද ?
(iii) කවියා සතු හිමිකම් ලෙස දක්වා ඇත්තේ මොනවාද?
(iv) වියළි මුඩුබිමක් පිළිබඳව දක්වන සාධක මොනවාද?
(v) පහත පදවලට සමාන පද ලියන්න
(ඈ) තිමිර -
(ආ) සොම්නස -

(ලකුණු2 X 5 10 යි

05)සපුමල් ගම තරුණ සමාජයේ ලේකම් වන සිරිමල් බණ්ඩාරට තම ගමේ නිෂ්පාදිත පලතුරු සඳහා වෙළඳ පොළක් ලබා ගැනීමට අවශ්‍ය වී ඇත. ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ සභාපති තුමාගෙන් මේ සඳහා අනුග්‍රහය ලබා ගැනීමටත්, මේ කටයුත්ත තවත් දියුණු කර ගැනීමට රජයේ බැංකුවකින් ණය මුදලක් ලබා ගැනීමටත් බලාපොරොත්තු වේ. මෙම සියලු කරුණු එකතු කර ප්‍රාදේශීය සභාපති වෙත යවන ලිපිය ලියන්න. වචන 100 ක් තිබීම ප්‍රමාණවත්ය.

නැතහොත්,

දෑසින් කඳුළු වැටෙද්දී සිය මව් පියන් වැඩිහිටි නිවාසවල නවත්වා යන දරුවෝ කෙතරම් සිටිත්ද? ඔවුන් කළ වරද කුමක්දැයි සිතමින් ආයාචනාත්මකව බලාසිටින්නේ තම දරුවන් රැගෙනයාමට පැමිණෙන තෙක්ය. දිනෙන් දින ඉදිවන වැඩිහිටි නිවාස පිළිබඳ ප්‍රවෘත්ති බොහෝ ඇති අතර ඉන් එකක් පිළිබඳව ඔබට කැමති පරිදි විශේෂාංග ලිපියක් ලියන්න. වචන 100 ක් පමණ තිබීම සෑහේ.

(ලකුණු15 යි)